## ඔබට TUE හිමිකම පවතින්නේ නම්, උත්තේජක පාලන ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු කරුණු:


SRI LANKA ANTI-DOPING AGENCY (SLADA)
Therapeutic Use Exemption (TUE) Application Form

Please complete all sections (in capital letters or typing). Athlete to complete sections 1, 2, 3 and 7; Physician to complete sections 4, 5 and 6. Illegible or incomplete applications will be returned and will need to be re-submitted in legible and complete form.

1. Athlete Information

Last Name: ______ First Name(s): ______
Female: ☐ Male: ☐ Date of Birth: ______
Address: ______
City: ______ Telephone: ______
E-mail: ______
Sport: ______ Discipline: ______

2. Previous Applications

Have you submitted any previous TUE application(s) to any Anti-Doping Organization for the same condition?
Yes ☐ No ☐
For which substance(s) or method(s)? ______
To whom? ______ When (Date)? ______
Decision: Approved ☐ Not approved ☐

Page 1 of 7

TUE හිමිකම යටතේ ඔබ ලබා ගත් ඖෂධ පිළිබඳ උත්තේජක පාලන පත්‍රයේ (Doping Control Form) සටහන් කිරීම

TUE හිමිකම ලබා ඇති නම් ඒ බව සඳහන් කිරීම

ඔබ ලබා ඇති TUE පත්‍රයේ පිටපතක් උත්තේජක පාලන නිලධාරියා වෙත ඉදිරිපත් කිරීම.




**සටහන:** ලෝක උත්තේජක මර්දන ආයතනයේ අන්තර්ජාතික ප්‍රමිතියට අනුකූලව, චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය ලබා ගැනීම සඳහා වන ක්‍රමවේද ප්‍රකාශයට පත් කර ඇත.

මෙම තොරතුරු ඕනෑම අවස්ථාවක යාවත්කාලීන විය හැකි බැවින් වඩාත් නිවැරදි නවතම තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් (SLADA), ජාත්‍යන්තර සංගමයෙන් (IF) හෝ ජාතික සංගමයෙන් (NF) ලබා ගැනීමට කටයුතු කරන්න.


**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය**

363/12, සුගතදස ස්ටේඩියම්-බ්ලොක් ඩී,
ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර,
සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

විද්‍යුත් තැපැල: sladasl@yahoo.com
දුරකථන අංකය : 0112 328 366, 0112 328 367, 0113 071 838
ෆැක්ස් : 0112 328 370
විශේෂ පැමිණිලි ඒකකය : 070 422 0422

AntiDoping SriLanka/ SLADA Education    slada_official    Sri Lanka Anti-Doping Agency


**Find out more at wada-ama.org**

# චිකිත්සක භාවිතය පළිබඳ මුක්තිය

## (Therapeutic Use Exemptions)




unesco Anti-Doping Convention

With the Support of the Fund for the Elimination of Doping in Sport

SLADA

WORLD ANTI-DOPING AGENCY
play true

# TUE යනු,

ක්‍රීඩකයෙකු වශයෙන් ඔබට කිසියම් ඖෂධයක් ලබාගත යුතු රෝගාබාධයක් හෝ තත්ත්වයක් තිබිය හැක. එම ඖෂධය තහනම් උත්තේජක ලැයිස්තුවේ අන්තර්ගත වී ඇත්නම්, ඔබ TUE සඳහා අයදුම් කළ යුතු ය. මෙමගින් ක්‍රීඩා තරග අතරතුර දී ද අදාළ ඖෂධය භාවිතා කිරීමට ක්‍රීඩකයාට අවකාශයක් ලබා දෙයි.



# අවශ්‍ය වන්නේ ඇයි?

තහනම් ලැයිස්තුවේ අන්තර්ගත තහනම් ද්‍රව්‍යක් හෝ ක්‍රමයක් වෛද්‍ය නිර්දේශය මත කිසියම් රෝගී තත්වයක් උදෙසා ඖෂධ (ආදේශක වෙනත් ඖෂධයක් නොමැති විට) ලබා ගත යුතු අවස්ථාවක.

# කා හට ද?



ඕනෑම ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙකු සඳහා TUE සඳහා අයදුම් කළ හැක. TUE පත්‍රය සමඟ ඔබ ලබා දෙන සියලු තොරතුරුවල රහස්‍යභාවය හා විශ්වසනීයත්වය ආරක්ෂා කෙරේ.

# කෙදිනද?



TUE අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුත්තේ,

- හැකි ඉක්මනින්,
- මීළඟ තරගාවලියට දින 30 කට පෙර,
- හදිසි අවස්ථාවක දී ප්‍රතිකාරයෙන් පසු (රෝගාබාධයක දී).

**ඔබගේ තරගාවලියට දින 30 කට පෙර**

See over for TUE tips

# TUE ක්‍රියාවලිය



1 TUE අයදුම්පත්‍රයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය/ ජාත්‍යන්තර සංගමය/ ප්‍රධාන තරග ඉසව් සංවිධායක (MEO) මගින් ඉල්ලුම් කිරීම.*

2 ඔබගේ ක්‍රීඩා වෛද්‍යවරයා විසින් සම්පූර්ණ කරන ලද TUE අයදුම්පත්‍රය (සියලු ම වෛද්‍ය වාර්තා ද සමඟ) SLADA වෙත භාරදීම.

3 ඔබ ඉදිරිපත් කළ TUE අයදුම්පත්‍රය, විශේෂඥ කමිටුවක් (TUE Committee) මගින් පරීක්ෂා කර බලා TUE හිමිකම ලබා දීම

හඳුනා ගත් රෝග තත්ත්වයට ප්‍රතිකාර කිරීමට තහනම් ද්‍රව්‍ය හා ක්‍රමයන් භාවිතා කළ යුතු නම්,

මෙමගින් ක්‍රීඩකයාගේ කාර්ය සාධනය වර්ධනය නොවන බවත්, ඉන් ක්‍රීඩකයාගේ සෞඛ්‍ය පමණක් යථා තත්වයට පත් වන බව තහවුරු වන්නේ නම්,

වෙනත් කිසිදු ආදේශක ඖෂධයක් නොමැති අවස්ථාවක.

4 ඔබ ඉල්ලුම් කර ඇති ඖෂධය භාවිතා කළ හැකි ද, නොහැකි ද යන්න පිළිබඳ ව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) විසින් හේතු සහිත තීරණයක් ලබා දෙනු ලැබේ. එම තීරණය පිළිබඳ නැවත සලකා බැලීම (අභියාචනයක් ඉදිරිපත් කිරීම) සඳහා ඔබට ඉල්ලුම් කිරීමට අයිතියක් ඇත.

* **Who do I contact/ where do I return my form?**

**National-level athletes:**
Sri Lanka Anti-Doping Agency (SLADA)

**International-level athletes:**
International Federation (IF)

**At Major Games:**
Major Event Organizer (MEO)